චන්දන ගුණසේකර
එක්සත් රාජධානිය





# සිංහල සිනමාව සහ මම 2

## ප්‍රේක්ෂකයකුගේ සටහනක්

සිත්තම්පලම් ශාලාවේ බිත්ති යටකරන් නැගී ඇති රූස්ස ගස් කඳන් දකිනවිට මගේ නෙතට කඳුළක් එක්වන්නේ නිරායාසයෙනි. මේ සම්පත් අපට අහිමි කල ඒ ජාතිවාදීන්ට ශාප වේවා. ඒ කාලයේ තැනූ චිත්‍රපට බොහොමයක් සත්‍ය සිද්ධීන් අළලා කෙරුණු බැව් මට මතකය. සිරිපාල සහ රංමැණිකා හා මරුවා සමඟ වාසේ චිත්‍රපට එකල රජරට පෙදෙස දෙවනත් කල මරුසිරා නමින් ප්‍රකට සමාජය විසින් දාමරිකයෙකු කල සිරිපාලගේ ජීවිත කතාව අළලා නිර්මාණය වුණි.

**විජය රඟපෑ චිත්‍රපට වල දෙබස් ගුවන් විඥුලියේ ප්‍රචාරය වූයේ එතුමාගේ හඬ ඇති කොටස් වලට වෙනෙකකුගේ හඬක් යොඳා සංස්කරණය කිරීමෙන් අනතුරුවය.**

මෙහි මරුවා සමඟ වාසේ වාණිජ චිත්‍රපටයක් ලෙසත් සිරිපාල සහ රංමැණිකා සම්භාව්‍ය කෘතියක් ලෙසත් ඉදිරිපත් කෙරුණි.
මරුවා සමඟ වාසේහි විජය කුමරණතුංග මරු-සිරා ලෙස රඟ පෑ අතර විමල් කුමාරද කොස්තා රඟ පෑ භූමිකාව කෙසේනම් අමතක කරම්ද? විකට නළුවකු ලෙස රඟපෑම ඇරඹී කොස්තා අපට අමතක නොවන රඟපෑම් රාශියක් දායාද කළද කිසිඳු ඇගැයීමකට ලක් නොවූ චරිතයකි. ඔහු සරුංගලේ චිත්‍රපටයේ කල රංගනය මහත් සේ අගය කල යුතුය.
මරුවා සමඟ වාසේහි පච්ච කොටන පච්චේගේ චරිතය මගේ ළපටි සිතට තදින් කාවැදුනි.

අම්මාගෙන් බැණුම් අසමින් අසල වනරොදක තිබූ වැල් වල කිරි වලින් නංගී හා මම පච්ච කොටා ගත් අයුරු මට අද මෙන් මතකයේ ඇත. වරෙක මම මරුසිරා වූ අතර ඇය පච්චේ වූවාය.

චිත්‍රපටයේ මරුසිරා දරුණු වීමට පෙර පපුවේ " අම්මා බුදු වේවා" යි කොටා ගත් අතර සමාජය ඔහුව දාමරිකයකු කිරීමෙන් අනතුරුව "මරුවා සමඟ වාසේ" යන පච්චය කොටා ගත්තේය. මේ සිදුවීම් මගේ සිතේ තදින්ම තැන්පත් විය.

බිනරි සහ සුදුබංඩා, මොනර තැන්න හා මුවන්පැලැස්ස ආදී චිත්‍රපට නැරඹීමෙන් පසු මට කොටි දත් මාලයක් පලඳින්නට ඕනෑම විය. මගේ අම්මා එයට කිසිසේත්ම ඉඩක් නොදුන්නාය. අනුරාධපුරයේ පොසොන් සමයේ කඩ වන්දනාවේ යද්දී මා අම්මාට ඇවටිලි කරමින් හඩා වැටී ඉල්ලූ භාණ්ඩ දෙකක් විය. එකක් ඔය කොටි දත් මාලය වූ අතර අනෙක සෙල්ලම් පිස්තෝලයකි.

ඒ කාලයේ රූපවාහිනි නොතිබුණ අතර අපගේ අනෙක් විනෝදාංශය වූයේ ගුවන් විදුලියට සවන් දීමයි. එහි විකාශනය වූ හංදියේ ගෙදර, මුවන් පැලැස්ස ආදී නාට්‍යයන්ට සවන් දීම අපි කිසිවිටෙක අමතක නොකළෙමු. උදා ගී, හින්දි ගී හා ඉරිදා දහවලේ විකාශනය වූ බයිලාද මාගේ ප්‍රියතම අංගයන් විය. පිබිදෙන ගායක පරපුරද එවැනිම මා රස විඳි වැඩසටහනකි.

මෙකල සති අන්තයේ වෙළඳ සේවයේ චිත්‍රපට ප්‍රචාරක වැඩසටහන් වලට සවන් දීම මා කිසිවිටෙක අතපසු නොකළෙමි. චිත්‍රපටය නරඹා ගුවන් විදුලියෙන් එහි සිංදු හා ජවනිකාවල දෙබස් ඛන්ඩ වලට නැවත නැවත සවන් දුනිමි. එකල පැවති ජේ ආර් ගේ ආණ්ඩුව විජය කුමාරණතුංගයන්ව නැක්සලයිට් වාදියෙකුයැයි හංවඩු ගසා එතුමාව වාරණයට ලක් කොට තිබූ කාලයයි. විජය රඟපෑ චිත්‍රපට වල දෙබස් ගුවන් විදුලියේ ප්‍රචාරය වූයේ එතුමාගේ හඩ ඇති කොටස් වලට වෙනෙකෙකුගේ හඩක් යොදා සංස්කරණය කිරීමෙන් අනතුරුවය. මෙම ලැජ්ජාසහගත බාලාංශ පංතියේ ක්‍රියාව දෙස එකල ළමා වයසේ පසුවූ මා පවා බැලූවේ අවංගඩා සහගතවය. මෙවැනි බලු වැඩ නිසා විජයට තිබූ ජනතා කැමැත්ත සිය දහස් ගුණයෙන් වැඩිවිය.

ගුවන් විදුලියේ චිත්‍රපට ප්‍රචාරක වැඩසටහන් වලට නිරතුරුව සවන් දීමෙන් රටේ බොහෝ සිනමා ශාලා වල නම ඒ ඒ නගරයත් සමගම මට කට පාඩම් විය.

විජිත-රත්මලාන, මානෙල් - දෙමටගොඩ,
සඳ ලංකා - සඳලංකාව,
මෙට්රෝ - නුගේගොඩ,
අනුර - අම්බලංගොඩ,
එස් කේ සිනමා - මාතර,
ජීවනී - පාණදුර, රොක්සි - වැල්ලවත්ත,
නැෂනල් - මහරගම, මිහිර - මීරිගම, ජානකී - මතුගම, රීගල් - කොළඹ, එල්ෆින්ස්ටන් - මරදාන,
තුසිත - පේරාදෙණිය, වෙම්බ්ලි - මහනුවර

ඉන් කිහිපයක් පමණි.

යකඩයා මරදංකඩවල විසූ අසාමන්‍ය ශක්තියකින් හෙබි මිනිසකු පිළිබඳව කල නිර්මාණයකි. එහිදී යකඩයාට රඟපෑ ගාමිණී ෆොන්සේකා සිර මැදිරියේ යකඩ කූරු නවන දර්ශනය නරඹා ප්‍රීතියෙන් ඔකඳව ඔල්වරසන් නැගූ අයුරු මට අද මෙන් මතකය.
මේ කුඩා වයසේදී මෙවැනි චිත්‍රපට නැරඹීමෙන් ළමා මනස විකෘති විය හැකි බැව් යමෙකු තර්ක කල හැකිය. එහෙත් දෙවියන්ගේ පිහිටෙන් මට එසේ නොවුණි. මම ජීවිතයට විශාල පන්නරයක් මේ වටිනා නිර්මාණ හා ජීවත් වීමෙන් එක් කර ගතිමි.

මගේ දරුවෝද මා හා බිරිඳ මෙන්ම චිත්‍රපට නැරඹීමේ රුසියෝය. දරුවන්ට ගැලපෙන චිත්‍රපට නැරඹීමට කිසි විටෙක මා වාරණ පනවා නැත. කුඩා කාලයේ චිත්‍රපට නැරඹීමෙන් මා ලද ආස්වාදය ඔවුනද විඳිනු බලා මම අභිංසකව සතුටු වෙමි. එහෙත් ඔවුනගේ වයසට වඩා මුහුකුරා ගියවුන්ගේ සංගමයෙන් ඔවුහු ඈත් කිරීමට නම් මා නිරතුරුවම වෙහෙස වෙමි. මන්ද එයින් විය හැකි හානිය මා අත්දැකීමෙන්ම දන්නා බැවිනි. ඊටත් පෙර මෙන් නොව සියලු දුසිරිත් ඇස් මානයේ අතේ දුරින් ඇත.

සයිබ අවකාශයේ බැරිවීමකින් හෝ පී ඕ ආර් එන් ටයිප් වුවහොත් තප්පරයක් යෑමට පෙර ලැබෙන ප්‍රතිඵලය මා අමුතුවෙන් ඔබ හට කිවයුතු නැති අප සියල්ලෝම අතවිඳ ඇති සත්‍යයකි. එහෙත් අපේ කාලයේ නිල් චිත්‍රපටියක් නැරඹීම වනාහී කණ කැස්බෑවා විය සිදුරින් හඳ දෙස බැලීමටත් වඩා අසීරු කාර්යයක් විය. එහි බැරෑරුම් හා අපහසුතාව මා විස්තර නොකළත් දන්නෝ දන්නා බැව් මා දනිමි. ඒ කර්තව්‍යයෙහි ලා මට ඇති අත්දැකීමකුත් මේ අවස්ථාවේ සඳහන් නොකළහොත් චිත්‍රපට හා බැඳුණු මගේ අතීතයට කරනා මදිපුංචි කමක් යැයි මට සිතේ.

එකල අප නමය හෝ දහය වසරේ ඉගෙනුම ලබමින් සිටියෙමු. පංතියේ සිටි නෙවිල් මෙවැනි වැඩවල ප්‍රමුඛයා විය. ඉගෙනීම හැරුණු කොට අනෙක් හැම වැඩකින්ම ඔහු මට ඉදිරියෙන් සිටියේය. ධනවත් මුදලාලි කෙනෙකුගේ පුතකු වූ ඔහුට අපට නැති බොහෝ දේ තිබුණි. පංතියේ මුලින්ම අත් ඔරලෝසුවක් බැන්දේ ඔහුය. අපට සිහිනයක් පමණක් වූ ගියර දහයේ ස්පෝට්ස් බයිසිකලයක් ඔහු සතු විය. එය අතගා බලා අපි සතුටු වීමු. කෙල්ලක හා ප්‍රේම සම්බන්ධයක් තිබුණේ ඔහුට පමණි. අපේ ගේ ඉස්සරහ පාරේ ඔහු ඇය හා කතාකරමින් යනු මහත් දුකකින් මා බලා සිටි අයුරු මට අදද සිහිවේ. කොට කලිසම් ඇඳ රබර් සෙරෙප්පු පය ලෑ මා දෙස කිසිවකු බැලූවේ නැත.

ඔය කියන දවසේ නෙවිල්ට ඔහුගේ වැඩිමහලූ යහළුවකු විසින් නිල් චිත්‍රපටයක් දී තිබුණි. වී එච් එස් කැසටයක් වූ එය නැරඹීමට ඩෙක් යන්ත්‍රයක්, ටී වී යන්ත්‍රයක් හෝ මූලික වශයෙන් තැනකුඳු නොවීය. බොහෝ පුද්ගලයන් ඇසුරු කල නෙවිල් රෙකෝඩ් බාරයකින් ඩෙක් යන්ත්‍රයක් කුලියට ගැනීමට සමත් විය. ටී වී යන්ත්‍රයක් සමඟ ස්ථානයට විසඳුමද ඔහුගෙන්ම ලැබිණි. එය නම් ඔහුගේ ගෙදරට ඉස්සරහ ගෙදරයි. ඒ ගෙදර මලයා අපට අවුරුදු කිහිපයකින් බාල වූ අතර චිත්‍රපටය නැරඹීමට රහ වැටී දෙමාපියන් එළියට යන වේලාවක් බලා අපට එහි යාමට කැමැත්ත දුනි.

ඒ ගෙදරට ගොස් ඩෙක් යන්ත්‍රය සම්බන්ධ කොට එය ටී වී යන්ත්‍රයට ටියුන් කිරීම ඊළඟ භාරදූර කාරිය විය. නෙවිල් ඒ කාරියටද කර ගැහුවේය. පැයක් පමණ වෙහෙසවීමෙන් අනතුරුව අපගේ කුතුහලය හා ආශාව සංසිඳවමින් මා කිසිදින දැක නොතිබුණු රූප හා ක්‍රියාවන් තිරය මත දිස්වන්නට විය. ඒත් එම චිත්‍රපටය පටන් ගෙන තිබුණේ මැදිනි. අපට එය මුල සිට බැලීමට උවමනා වූයෙන් නෙවිල් එය නවතා රිවයින්ඩ් කෙරුමට පටන් ගති. මහත් බියකින් පසුවූ ගෙදර අයිති මලයා රූපරාමු කිහිපය නැරඹීමෙන් ඔකඳව ගිය සිත් ඇතිව ආයෙත් යමක් සිදුවී ආමාරුවෙන් සාදාගත් නිල බැලීමට නොලැබේවි යැයි බය වී හදිසියේම "කල්පනාවෙන් රිවයින් කරන්න" යැයි පැවසුවේ අප සියලූ දෙනාම සිනා සයුරේ ගිල්වමිනි.

මගේ නිල් චිත්‍රපට අත්දැකීම එසේ ඇරඹිණි. ඉන්පසු තව එවැනි චිත්‍රපටයක් නැරඹීමට අවස්ථාව උදාවුණේ විශ්ව විද්‍යාලයටත් ගිය පසුයි. අප පළමු වරට නිල බැලු ගෙදර මලයාට ටී වී යන්ත්‍රයේ චැනල් සියල්ල මාරු කළා යැයි ඔහුගේ පියා හොඳටම දෙහි කැපූ බැව් පසුව ආරංචි විය. මට අදටත් පරිස්සමින් රිවයින් කරන ලෙස කියූ ඔහුගේ ඉල්ලීම සිහිවී මුවඟ සිනහවක් ඇතිවීම නොවැළැක්විය හැකි කරුණකි.

අදට මෙතනින් නවතින්නම්. ඊළඟට මෙම මතකයේ අවසාන කොටසින් හමුවෙමු.

